# ප්‍රස්තාවනාව.

" ග්‍රාමීය ආර්ථික සංවර්ධනය සඳහා විධිමත් හා අවිධිමත් මූල්‍ය නියෝජිතයින්ගේ කාර්යභාරය " නම් වූ මෙම පර්යේෂණ නිබන්ධය රුහුණ විශ්වවිද්‍යාලයේ වාණිජපති උපාධියේ එක් අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරන්නකි.

රටක ආර්ථික සංවර්ධන ක්‍රියාදාමයේ දී අවශ්‍ය මූල්‍ය සම්පත් සැපයීම වැදගත් අවශ්‍යතාවයකි. ඒ මගින් සමාජය සතුව පවත්නා භෞතික හා මානව සම්පත් වඩා කාර්යක්ෂම ආකාරයෙන් නිෂ්පාදන ක්‍රියාදාමයට සම්බන්ධ කරගත හැකි වේ. ග්‍රාමීය අංශ සතුව පවත්නා සම්පත්, නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීමේ දී අවශ්‍ය මූල්‍ය සම්පත් ලබාගැනීම හා ඒවා කාර්යක්ෂම ආකාරයෙන් භාවිත කිරීම පිළිබඳව විවිධ ගැටළු පවතී. ග්‍රාමීය මූල්‍ය අවශ්‍යතාවන් ඉටුකර ගැනීමේ දී විධිමත් හා අවිධිමත් මූල්‍ය නියෝජිතයෝ වැදගත් කාර්යභාරයක් ඉටු කරති. ග්‍රාමීය මූල්‍ය වෙළඳපළ තුළ ක්‍රියාත්මක වන මෙම මූල්‍ය නියෝජිතයින් ග්‍රාමීය අංශයට මූල්‍ය සම්පත් සැපයීමේ දී අනුගමනය කරනු ලබන උපාය මාර්ගයන් වෙනස් වේ. එම උපාය මාර්ගයන්ගේ බලපෑම විමසා බැලීම වැදගත් වේ. මෙම අධ්‍යයනය සඳහා අවශ්‍ය දත්ත ක්ෂේත්‍ර සමීක්ෂණය මගින් ලබා ගැනුණි. මේ සඳහා අධ්‍යයන ප්‍රදේශය වශයෙන් මොණරාගල දිස්ත්‍රික්කයෙන් තෝරාගන්නා ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුනක ජීවත්වන කුටුම්භ නියදියකින් තොරතුරු එක්රැස් කරන ලදී. මෙයට අමතරව ද්විතීයික මූලාශ්‍රයන්ගෙන්ද දත්ත ලබාගන්නා ලදී.

මෙම පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා පර්යේෂණ කටයුතුවල නිරත වීමට සිදු වූයේ අධ්‍යයන නිවාඩුවකින් තොරව බව මෙහිලා සඳහන් කළ යුතුයි.

පර්යේෂණ මාතෘකාව තෝරා දීමෙන් ද වරින්වර මතු වූ ගැටලු නිරාකරණය කර දීමෙන්ද නිරන්තරව උපදෙස් හා දිරිගැන්වීම් සැපයීමෙන් ද මෙම නිබන්ධය සඳහා කලක් උපදේශකවරයෙකු ලෙස කටයුතු කරමින්, තම වටිනා කාලය සහ ශ්‍රමය කැපකිරීමෙන් කටයුතු කල, රුහුණ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය ඩී. අතපත්තු මහතා විසින් මා වෙත දක්වනු ලැබූ ඇඩි අනුග්‍රහය සහ මඟපෙන්වීම ප්‍රථමයෙන් ම ස්තූති පූර්වක ව සිහිපත් කළ යුතු වේ.

එමෙන් ම අවශ්‍ය උපදෙස් ලබා දෙමින් සහ නිසි ලෙස මෙහෙයවමින් නිබන්ධය සඳහා උපදේශකවරයා වශයෙන් කටයුතු කළ රුහුණ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ, අංශ ප්‍රධාන පියසිරි විතානගේ මහතා තම වටිනා කාලය සහ ශ්‍රමය කැප කිරීමෙන් මා හට දැක්වූ නොමද සහයෝගය කෘතඥතා පූර්වකව සිහි කරමි.

නිබන්ධයේ ව්‍යාකරණ දොස් නිවැරදි කර දෙමින් මට සහය දැක් වූ සිංහල අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය පී. බී. ඒකනායක මහතාට හා විශ්‍රාමික විදුහල්පති රත්නායක මහතාට බෙහෙවින් ස්තූතිවන්ත වෙමි. තවද, මෙහි යතුරුලියන කටයුතු කරදුන් වෙදගේ මහත්මියට ද, ඡායා පිටපත් ලබාගැනීමට පහසුකම් සලසන ලද රුහුණ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලන අධ්‍යයනාංශයේ අංශ ප්‍රධාන ආචාර්ය ඩී. පී. වික්‍රමසිංහ මහතාට ද, මෙම කාර්යයේ දී මට සහය දැක් වූ පණ්ඩිතසේකර, එමිල්, සරත්, ප්‍රනාන්දු, රණවීරබණ්ඩා, විජේකෝන්, සුගත් යන හිතවතුන්ට ද ස්තූතිවන්ත වෙමි.